# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
# තනතුරු ඇබෑර්තු

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා සුදුසුකම් ඇති අයවළුන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

01. තනතුර : **අධ්‍යක්ෂ (නීති) "ජ්‍යෙෂ්ඨ කළමනාකාර" (HM I-I)**

i. පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව : 01
ii. වැටුප් පරිමාණය : HM I-I (2025) - 140,640 - 15x4,100 - 202,140/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව 2027.01.01 දින සිට මෙම මූලික වැටුපට හිමිකම් කියනු ලැබේ.)
iii. වයස් සීමාව : අවු: 35 ට නොඅඩු විය යුතු අතර, අවු:55 ට නොවැඩි විය යුතුය

**<u>බාහිර අයදුම්කරුවන් සඳහා:-</u>**

(අ). අධ්‍යාපන සුදුසුකම් :-

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීති උපාධියක් සහ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීති අවසන් විභාගය (Attorney at Law) සමත්ව තිබීම සමඟ නීති ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

(ආ). පළපුරුද්ද :-

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙස දිවුරුම් දීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක නීතිඥයෙකු ලෙස කළමනාකාර මට්ටමේ සේවා පළපුරුද්දක් ලබා තිබීම.

නීති ක්ෂේත්‍රයේ සැලසුම් කිරීම/ ප්‍රතිපත්ති විශ්ලේෂණය සම්බන්ධයෙන් පළපුරුද්දක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :-**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති) ලෙස "කළමනාකාර" සේවා ගණයෙහි I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

02. තනතුර **: සහකාර අධ්‍යක්ෂ (පාලන) MM I-I (II ශ්‍රේණිය)**

i. පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව : 01

ii. වැටුප් පරිමාණය : MM I-I (2025) - 91,690 - 10x2,480 -15x3,450 - 168,240 (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව 2027.01.01 දින සිට මෙම මූලික වැටුපට හිමිකම් කියනු ලැබේ.)

iii. වයස් සීමාව : අවු: 22 ට නොඅඩු විය යුතු අතර, අවු:45 ට නොවැඩි විය යුතුය

iv. අධ්‍යාපන සුදුසුකම් :

**බාහිර අයදුම්කරුවන් සඳහා:-**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් කළමනාකරණය, විද්‍යාව, නීතිය, පරිපාලනය, පිළිබඳ ලබාගත් ප්‍රථම උපාධිය

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකරණ විෂය ක්ෂේත්‍රයේ වසර තුන (03) ක පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :-**

කනිෂ්ඨ කළමනාකාර සේවා ගණයේ I ශ්‍රේණියේ පරිපාලන නිලධාරී තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

03. තනතුර : **සහකාර අධ්‍යක්ෂ (තක්සේරු හා වන්දි) MM I-I (II ශ්‍රේණිය)**

i. පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව : 01

ii. වැටුප් පරිමාණය : MM I-I (2025) - 91,690 - 10x2,480 -15x3,450 - 168,240 (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව 2027.01.01 දින සිට මෙම මූලික වැටුපට හිමිකම් කියනු ලැබේ.)

iii. වයස් සීමාව : අවු: 22 ට නොඅඩු විය යුතු අතර, අවු:45 ට නොවැඩි විය යුතුය

iv. අධ්‍යාපන සුදුසුකම් :

**<u>බාහිර අයදුම්කරුවන් සඳහා:-</u>**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වතු පාලනය හා තක්සේරුකරණය, පිළිබඳ ලබාගත් ප්‍රථම උපාධිය

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක තක්සේරුකරුවෙකු ලෙස වසර තුන (03) ක පළපුරුද්ද

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :-</u>**

කනිෂ්ඨ කළමනාකාර සේවා ගණයේ I ශ්‍රේණියේ තක්සේරු පරීක්ෂක තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

04. තනතුර : **සහකාර අධ්‍යක්ෂ (කලාප) MM I-I (II ශ්‍රේණිය)**

i. පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව : 03

ii. වැටුප් පරිමාණය : MM I-I (2025) - 91,690 - 10x2,480 -15x3,450 -168,240 (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව 2027.01.01 දින සිට මෙම මූලික වැටුපට හිමිකම් කියනු ලැබේ)

iii. වයස් සීමාව : අවු: 22 ට නොඅඩු විය යුතු අතර, අවු:45 ට නොවැඩි විය යුතුය

iv. අධ්‍යාපන සුදුසුකම් :

**<u>බාහිර අයදුම්කරුවන් සඳහා:-</u>**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ශාස්ත්‍රවේදී උපාධිය, කළමනාකරණය, විද්‍යාව, කෘෂි විද්‍යාව, නීතිය, පරිපාලනය පිළිබඳ ලබාගත් ප්‍රථම උපාධිය

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ඉඩම් විෂය ක්ෂේත්‍රයේ වසර තුන (03) ක පළපුරුද්ද

05. තනතුර : **තොරතුරු තාක්ෂණ නිලධාරී JM I-I (II ශ්‍රේණිය)**

i. පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව : 01
ii. වැටුප් පරිමාණය : JM I-I (2025) - 72,650/- 10x1,360 -18x 2,040 - 122,970/-

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව 2027.01.01 දින සිට මෙම මූලික වැටුපට හිමිකම් කියනු ලැබේ.)

iii. වයස් සීමාව : අවු: 22 ට නොඅඩු විය යුතු අතර, අවු:45 ට නොවැඩි විය යුතුය
iv. අධ්‍යාපන සුදුසුකම් :

**<u>බාහිර අයදුම්කරුවන් සඳහා:-</u>**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම සහ එම සුදුසුකම් ලබා තිබීමෙන් පසු රජයේ හෝ රාජ්‍ය අංශයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනය අවම වශයෙන් වසර එකක (01) තොරතුරු තාක්ෂණය පිළිබඳ පළපුරුද්දක් ලබා තිබීම

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :-</u>**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කළමනාකරණ සහකාර සේවා ගණයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු ලෙස අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

06. තනතුර : **තක්සේරු නිලධාරී MA 3 (III ශ්‍රේණිය)**

i. පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව : 01
ii. වැටුප් පරිමාණය : MA 3 (2025) - 53,940/- 10x800- 11x 1,190 -10x1,320 5x1,350 - 94,980/-

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව 2027.01.01
දින සිට මෙම මූලික වැටුපට හිමිකම් කියනු ලැබේ.)

iii. වයස් සීමාව : අවු: 22 ට නොඅඩු විය යුතු අතර, අවු:45 ට නොවැඩි විය යුතුය

iv. අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් තක්සේරුකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

රජයේ හෝ පිළිගත් රාජ්‍ය ආයතනයක තක්සේරුකරණය පිළිබඳව සේවා පළපුරුද්දක් ලබා තිබීම අතිරේක සුදුසුකම් සේ කළකනු ලැබේ.

07. වෙනත් ප්‍රතිලාභ:-

i. මෙම පත්වීම ස්ථිරය.
ii. සඳහන් කරන ලද ඉහත වැටුපට අමතරව ඒ ඒ තනතුරු සඳහා රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.
iii. සේවක අර්ථසාධක අරමුදලට ආයතනයේ 15% ක දායකත්වයක්ද, නිලධාරියාගෙන් 10% ක දායකවීමක් ද සමඟ නිලධාරියා වෙනුවෙන් 3% ක සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට බැර කරනු ලැබේ.

08. දැනටමත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන්ට ඉහත සඳහන් උපරිම වයස් සීමාවන් බලපවත්වනු නොලැබේ.

09. අයදුම්කරුවන් විසින් උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික සහ අනෙකුත් අදාළ සහතික පත්වල සහතික කරන ලද පිටපත් සහිතව තමා www.lrc.gov.lk යන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන් බාගත කරගනු ලබන අයදුම්පත්‍රය සම්පූර්ණ කර, 2026.11.06 දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

10. සියලුම අයදුම්කරුවන්ගේ තොරතුරු ලුහුඬු ලැයිස්තුගත කර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

11. දැනටමත් රාජ්‍ය දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතනවල සේවය කරනු ලබන නිලධාරින්ගේ ඉල්ලුම්පත් තම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ඔවුන් මෙම තනතුර සඳහා තෝරා ගතහොත් නිදහස් කිරීමට හැකි ද යන්න සඳහන් කර තිබිය යුතුය.

12. ඉල්ලුම්පත් යොමු කිරීමේදි ඉල්ලුම්පත බහා එවනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිළිව සඳහන් කර එවිය යුතුය.

සභාපති

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
අංක 475
කඩුවෙල පාර
බත්තරමුල්ල
2026.10.07